# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/22 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාද — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68 (70)/76.

**(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනත**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

විී. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග හදිසි අවස්ථා (වෙළෙඳාම විධිමත් කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

**I වන කොටස**

2. (1) 1961 අංක 62 දරන වෙළෙන්දන්ට බලපත්‍ර දීමේ පනතේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, යම් භාණ්ඩයක වෙළෙන්දකු වශයෙන් වෙළෙඳ ව්‍යාපාරය පවත්වා ගෙන යාමට බලය දෙමින් නියම බලධරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නේ නම් මිස හෝ ඒ බලපත්‍රයෙහි නැතහොත් ගැසට් පත්‍රයෙහි සහ නියම බලධරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රවෘත්ති පත්‍රවල සඳහන් කරනු ලබන, බලපත්‍රයේ නියම හා කොන්දේසිවලට අනුකූල නොවන ආකාරයකින් හෝ කිසිම තැනැත්තකු විසින් ඒ භාණ්ඩයෙහි වෙළෙන්දකු වශයෙන් ව්‍යාපාරය පවත්වා ගෙන යාම නොකළ යුතු ය.

(2) (1) වන ඡෙදය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම, නියම බලධරයාගේ තනි හා පරම අභිමතය අනුව සිදු විය යුතු අතර එම අභිමතය ක්‍රියාත්මක කිරීම කිසිම අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

3. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයකින් නියම බලධරයා විසින් දක්වනු ලබන ගාස්තුවක් නියම බලධරයා වෙත ගෙවනු ලැබුවහොත් මිස, නියම බලධරයා විසින් යම් තැනැත්තකුට කිසිදු බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(2) වෙනස් පන්තිවල වෙළෙන්දන් සහ වෙනස් වර්ගවල භාණ්ඩ වෙනුවෙන් 2 වන නියෝගය යටතේ එකිනෙකට වෙනස් නියම හා කොන්දේසි දක්වනු ලැබිය හැකි ය.

(3) 2 වන නියෝගය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම 12 වන නියෝගයේ විධිවිධාන අනුව නියම බලධරයා විසින් අවලංගු කරනු හෝ අත් හිටවනු ලබන තුරු හෝ 13අ වන නියෝගයේ විධිවිධාන අනුව ඔහු විසින් අවලංගු කරනු ලබනතුරු වලංගු වන්නේ ය.

(4) 2 වන නියෝගය යටතේ නිකුත් කරන ලද කිසිදු බලපත්‍රයක් වෙනත් තැනැත්තකුට පැවරිය නොහැකි වන අතර එබඳු යම් පැවරීමක් ශුන්‍ය හා බලරහිත වන්නේ ය.

(5) 2 වන නියෝගය යටතේ නිකුත් කරනු ලබන සියලුම බලපත්‍ර පිළිබඳ වාර්තා නියම බලධරයා විසින් තබා ගත යුතු ය.

4. (1) නියම බලධරයා විසින්, ඔහුගේ මතය අනුව, යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමෙහි, ආනයනය කිරීමෙහි, විකිණීමෙහි සහ පරිභෝජනය කිරීමෙහි ලා උනන්දුවක් දක්වන තැනැත්තන් විමසා ඒ භාණ්ඩය බෙදා හැරීමේ ක්‍රමයක් පිළිබඳව තීරණයක් කළ හැකි ය.

භාණ්ඩවල ලේබල් යෙදීම, මිල සටහන් කිරීම සහ භාණ්ඩ ඇසිරීම නියම කරන විධිවිධාන, නියම බලධරයා විසින් එම බෙදා හැරීමේ ක්‍රමයෙහි සලස්වනු ලැබිය හැකි ය.

(2) එවැනි සෑම බෙදාහැරීමේ ක්‍රමයක් ම ගැසට් පත්‍රයෙහි ද, යටත් පිරිසෙයින් එක් සිංහල, එක් දෙමළ සහ එක් ඉංග්‍රීසි පත්‍රයක ද පළ කරනු ලැබිය යුතු ය.

5. (1) නියම බලධරයා විසින් සිය මෙහෙයීමෙන් ම හෝ ලියවිල්ලකින් වූ යම් පැමිණිල්ලක් ලැබුණු විට හෝ යම් භාණ්ඩයක් බෙදා හැරීමේ ක්‍රමය ක්‍රියාවේ යෙදෙන ආකාරය පරීක්ෂා කළ හැකි ය.

(2) එවැනි යම් පරීක්ෂණයකින් පසු නියම බලධරයා විසින් එම බෙදා හැරීමේ ක්‍රමය වෙනස් කිරීම හෝ සකස් කිරීම කළ හැකි ය. එම වෙනස් කිරීම හෝ සකස් කිරීම 4 (2) වන නියෝගයේ විධිවිධාන සලසා ඇති පරිදි පළ කරනු ලැබිය යුතු ය.

(3) යම් භාණ්ඩයක් බෙදා හැරීමේ ක්‍රමයේ විධිවිධානවල කිසිදු විධිවිධානයක් කිසිම වෙළෙන්දකු විසින් කඩ නොකළ යුතු ය.

6. (1) යම් භාණ්ඩයක් යම් උපරිම මිලකට (තොග සහ සිල්ලර) වැඩියෙන් නොවිකිණිය යුතු ද ඒ උපරිම මිල (තොග සහ සිල්ලර), ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් නියම බලධරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

එසේ වුව ද, යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් මේ නියෝගයේ ඉහතින් වූ විධිවිධාන යටතේ නියම බලධරයා විසින් නියම කරනු ලැබූ මිල, ඒ භාණ්ඩය සම්බන්ධයෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 42 දරන ජාතික මිල කොමිෂන් සභා පනතේ 20 වන වගන්තිය යටතේ සාදන ලද හෝ සාදන ලදැයි සලකනු ලබන නියමය මගින් නියම කරන ලද මිලට අනුකූල විය යුතු ය.

එසේ ම තවදුරටත්, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 42 දරන ජාතික මිල කොමිෂන් සභා පනතේ 20 වන වගන්තිය යටතේ නියමයක් කරනු ලැබ නොමැති හෝ කරන ලදැයි සලකනු නොලබන යම් භාණ්ඩයක උපරිම මිල (1) වන ඡෙදය යටතේ වූ නියමයක් මගින් නියම බලධරයා විසින් නියම කරනු ලබන අවස්ථාවක, ඔහු විසින් ඒ නියමය ජාතික මිල කොමිෂන් සභාව වෙත යොමු කළ හැකි අතර, එම යොමු කිරීම ජාතික මිල කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් වූ පරිද්දෙන්, ජාතික මිල කොමිෂන් සභාව විසින්, ඒ යොමු කිරීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ය. ඒ යොමු කිරීම කරන ලද්දේ වුව ද, නියම බලධරයා විසින් කරන ලද ඉහත කී නියමය වලංගු හා බලසහිත වන්නේ ය. නියම බලධරයා විසින් කරන ලද නියමය ඒ කොමිෂන් සභාව විසින් වෙනස් කරනු ලබන අවස්ථාවක ඒ වෙනස් කිරීමට අනුකූලව නියම බලධරයා විසින් මේ නියෝගය යටතේ ඒ භාණ්ඩය සම්බන්ධයෙන් අලුත් නියමයක් කළ යුතු ය.

(2) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයකින් නියම බලධරයා විසින් දන්වනු ලබන යම් භාණ්ඩයක් විකුණන සෑම වෙළෙන්දෙකුම, විකිණීම සඳහා ඇති එවැනි සෑම භාණ්ඩයකම උපරිම විකුණුම් මිල දක්වෙන දැන්වීමක් තම ව්‍යාපාරික ස්ථානයේ පැහැදිලිව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

(3) යම් භාණ්ඩයක ලේබල් යෙදීම, මිල සටහන් කිරීම සහ ඇසිරීම සම්බන්ධයෙන් නියම බලධරයා විසින් වෙළෙන්දන්ට සාමාන්‍ය විධාන නිකුත් කළ හැකි අතර යම් වෙළෙන්දන්ගේ පන්තියකට නිකුත් කෙරෙන සාමාන්‍ය විධාන මගින් හෝ යම් විශේෂ වෙළෙන්දකුට නිකුත් කෙරෙන විශේෂ විධාන මගින්—

(අ) යම් එක් දිනයක විකිණිය යුතු යම් භාණ්ඩයක උපරිම ප්‍රමාණය ;

(ආ) ඒ භාණ්ඩය විකිණිය යුත්තේ යම් වේලාවක් තුළ දී සහ යම් ස්ථානයක දී ද ඒ වේලාව සහ ස්ථානය ; සහ

(ඇ) ඒ භාණ්ඩය විකිණීම පිළිබඳ වෙනත් යම් කොන්දේසි ;

අවස්ථාවෝචිත පරිදි ඒ වෙළෙන්දන්ගේ පන්තියට හෝ ඒ වෙළෙන්දට නියම කිරීම ද කළ හැකි ය. තව ද, ඒ විධාන අදාළ වන්නේ යම් වෙළෙන්දකුට ද ඒ සෑම වෙළෙන්දකුම ඒ විධාන අනුව ක්‍රියා කළ යුතු ය.

(4) නියම බලධරයා විසින් (3) වන ඡෙදය යටතේ නිකුත් කරනු ලබන සෑම සාමාන්‍ය විධානයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

(5) නියම බලධරයා විසින් (3) වන ඡෙදය යටතේ යම් වෙළෙන්දකු වෙත නිකුත් කරනු ලබන සෑම විශේෂ විධානයක් ම ලියවිල්ලකින් විය යුතු අතර එය නිකුත් කරනු ලබන්නේ යම් වෙළෙන්දකු වෙත ද ඒ වෙළෙන්ද වෙත භාර දිය යුතු ය. තවද, එවැනි යම් විධානයක් ඒ වෙළෙන්දගේ ව්‍යාපාරික ස්ථානයෙහි ඔහුගේ ලිපිනයට තැපැල් මගින් යවන ලද නම් එය ඔහුට භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. එසේ තැපෑලෙන් භාර දෙනු ලැබූ බව ඔප්පු කිරීමේ දී විධානය ඇතුළත් ලේඛණය නිසි පරිදි ලිපිනය ලියා තැපැල් කළ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් වන්නේ ය.

7. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් නියම බලධරයා විසින් නියම කරනු ලබන ප්‍රමිතිවලට හා විස්තරවලට අනුකූල නොවන යම් භාණ්ඩයක් විකිණීම පිළිබඳ පැමිණිලි නියම බලධරයා විසින් විභාග කරනු ලැබිය හැකි ය. යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ප්‍රමිති හා විස්තර ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය මගින් නියම කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ ප්‍රමිති හා විස්තර මේ නියෝගයේ කාර්යය සඳහා නියම බලධරයා විසින් නියම කරනු ලැබූ ප්‍රමිති හා විස්තර ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන ඡෙදය යටතේ වූ යම් පැමිණිල්ලක් ඒ විකිණීමේ දින සිට දින හතක් ඇතුළත නියම බලධරයා වෙත ලැබෙන පරිදි ලියවිල්ලකින් කළ යුතු ය.

(3) එවැනි පැමිණිල්ලක් සම්බන්ධයෙන් පවත්වනු ලබන යම් විභාගයක දී, ඒ පැමිණිල්ල කරනු ලැබුවේ යම් වෙළෙන්දකුට විරුද්ධව ද ඒ වෙළෙන්දට පෞද්ගලිකව හෝ ඔහු වෙනුවෙන් අනුයෝජිතයකු මගින් හෝ සිය කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් නියම බලධරයා විසින් දිය යුතු ය.

(4) මේ නියෝගය යටතේ නියම කර ඇති හෝ නියම කරනු ලැබ ඇතැයි සලකනු ලබන ප්‍රමිතිවලට හෝ විස්තරවලට අනුකූල නොවන භාණ්ඩයක විකිණීමක් කර ඇතැයි නියම බලධරයාගේ මතය වන අවස්ථාවක අතෘප්තියට පත් පාර්ශ්වකරුට වන්දි ගෙවන ලෙස හෝ භාණ්ඩය ප්‍රතියෝජනය කරන ලෙස හෝ ඒ භාණ්ඩය වෙනුවෙන් ගෙවන ලද මුදල ආපසු ගෙවන ලෙස හෝ නියම බලධරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(5) (4) වන ඡෙදය යටතේ වූ නියමයක් ලියවිල්ලකින් කළ යුතු අතර එය ඒ වෙළෙන්ද වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය. තවද, ඒ වෙළෙන්ද ඒ නියමයට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

8. (1) තම සන්තකයෙහි යම් භාණ්ඩයක් ඇති කිසිම වෙළෙන්දකු විසින් ඒ භාණ්ඩය විකිණීමට ප්‍රතික්ෂේප නොකළ යුතු ය. යම් භාණ්ඩයක සුළු ප්‍රමාණයක් සිල්ලර වශයෙන් මිල දී ගැනීම යම් තැනැත්තන්ගේ සිරිතක් වන අවස්ථාවක, එවැනි යම් සුළු ප්‍රමාණයක් යම් තැනැත්තකුට විකිණීම කිසිම වෙළෙන්දකු විසින් ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

(2) (1) වන ඡෙදය යටතේ වරදක් සඳහා යම් නඩු පැවරීමක දී—

(අ) ප්‍රශ්නයට භාජන වී ඇති අවස්ථාවේ දී තමා භාණ්ඩයේ සාධාරණ ප්‍රමාණයක් සැපයූ බව, හෝ ඉල්ලා සිටින ලද ප්‍රමාණය සැපයීමට තරම් සෑහෙන ප්‍රමාණයක් තමා සන්තකයෙහි නොතිබූ බව ; හෝ

(ආ) තමා එම භාණ්ඩය සම්බන්ධ වෙළඳ ව්‍යාපාරය පවත්වා ගෙන ගියේ තොග වෙළෙන්දකු වශයෙන් පමණක් බව සහ ගැණුම්කරු විසින් ඉල්ලා සිටින ලද ප්‍රමාණය විකිණීම තොග වෙළඳාම පිළිබඳ සාමාන්‍ය පිළිවෙතට පටහැනි විය හැකිව තිබුණු බව ; හෝ

(ඇ) ප්‍රශ්නයට භාජනය වී ඇති අවස්ථාවේ දී භාණ්ඩය විකිණීම යම් ලිඛිත නීතියක යම් විධිවිධානයකට හෝ 6 වන නියෝගය යටතේ තමා වෙත නිකුත් කර තිබෙන යම් විධානයකට පටහැනි විය හැකිව තිබුණු බව ;

ඔප්පු කිරීම චූදිතයාට සෑහෙන විත්ති වාචකයක් වන්නේ ය.

(3) (2) වන ඡෙදයේ කාර්‍ය්‍ය සඳහා, සාධාරණ ප්‍රමාණය කොපමණ ද යන්න නිශ්චය කිරීමෙහි ලා ඔහුගේ සහ ඔහුගේ නිවසේ සාමාජිකයන්ගේ පරිභෝජනය සඳහා යුක්තිසහගත ලෙස අවශ්‍ය වන ඒ භාණ්ඩයේ ප්‍රමාණය කෙරෙහි සැලකිල්ලක් දැක්විය යුතු ය.

9. යම් යම් වාර වාර්තා, ශේෂ පත්‍ර, ගිණුම් ලේඛන, බඩු ලැයිස්තු සහ තම කටයුතු අතරින් කිසිවක් ඉටුකිරීම සඳහා යම් තොරතුරක් අවශ්‍ය යයි නියම බලධරයා සලකන්නේ නම්, ඒ තොරතුරු ද ඉදිරිපත් කරන ලෙස යම් වෙළෙන්දකුගෙන් ඉල්ලා සිටීමට නියම බලධරයාට බලය ඇත්තේ ය.

10. මේ නියෝගවල විධිවිධාන අනුව කටයුතු කරනු ලබන්නේ දැයි නිසැකව දැන ගැනීමේ කාර්‍ය්‍ය සඳහා—

(අ) යම් වෙළෙන්දකු විසින් ස්වකීය වෙළෙඳ ව්‍යාපාරය පවත්වා ගෙනයනු ලබන ස්ථානයට දිවා කාලයේ සියලු යුක්තිසහගත වේලාවන්හිදී ඇතුලුවීමට සහ ඒ ස්ථානය පරීක්ෂා කිරීමට, තවද

(ආ) ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් පවත්වා ගෙන යායුතු යයි මේ නියෝගවලින් හෝ මේ නියෝගය යටතේ හෝ නියම කර ඇති යම් වාර්තා පරීක්ෂා කිරීමට සහ එම වාර්තාවල පිටපත් ගැනීමට,

නියම බලධරයාට බලය ඇත්තේ ය.

11. මෙ නියෝග මගින් නියම බලධරයා වෙත පවරා ඇති හෝ නියම කර ඇති යම් බලයක්, කටයුත්තක් හෝ කාර්‍ය්‍යයක් ඒ බලධරයා විසින් ලියවිල්ලකින් යම් තැනැත්තකු වෙත පවරනු ලැබිය හැකි ය.

12. (1) මෙ කොටසේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් කඩකරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම සහ වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද තවදුරටත් කරගෙන යන සෑම දිනයක් ම සම්බන්ධයෙන් රුපියල් පනහක දඩයකට ද ඔහු යටතේ වන්නේ ය.

(2) 6 වන නියෝගයේ (1) වන ඡෙදය යටතේ සාදන ලද නියමයක් කඩකරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට සති හතරකට නොඅඩු වූ ද මාස හයක් නොඉක්මවන්නා වූ ද කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට සහ ඊට අතිරේකව රුපියල් හත්දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට ද ඔහු යටත් වන්නේ ය.

13. (1) අධිකරණයක් විසින් යම් වෙළෙන්දෙකු—

(අ) (6) වන නියෝගයේ (1) වන ඡෙදය යටතේ සාදන ලද හෝ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 42 දරණ ජාතික මිල කොමිෂන් සභා පනතේ 20 වන වගන්තිය යටතේ සාදන ලද හෝ සාදන ලදැයි සලකනු ලබන නියමයකින් යම් භාණ්ඩයක් සඳහා නියම කරනු ලබන මිලට වැඩි මිලකට ඒ භාණ්ඩය විකිණීම සම්බන්ධයෙන් ; හෝ

(ආ) 7 වන නියෝගයේ (4) වන ඡෙදය යටතේ සාදන ලද නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම සම්බන්ධයෙන් ; හෝ

(ඇ) 8 වන නියෝගයේ විධිවිධාන කඩකිරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ අවස්ථාවක, නියම බලධරයා විසින් නියමයක් මගින් ඒ වෙළෙන්දාගේ බලපත්‍රය අවලංගු කිරීම හෝ ඒ නියමයේ සඳහන් යම් කාලපරිච්ඡේදයකට ඒ බලපත්‍රය අත්හිටුවීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන ඡෙදය යටතේ නියමයක් කරනු ලැබුවේ යම් වෙළෙන්දකුට විරුද්ධව ද, ඒ වෙළෙන්ද විසින්, ඒ නියමය කරනු ලැබූ නියම බලධරයා විසින් හෝ වෙනුවෙන් ඒ නියමය ඒ වෙළෙන්ද වෙත භාරදෙන ලද දිනයෙන් පසු එක් මාසයක් ඉකුත්වීමට පෙර, වෙළඳාම භාර අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් ගැන ක්‍රියා කිරීමේදී, ඒ අභියාචනය ඉදිරිපත් කරනු ලැබුවේ යම් නියමයකට විරුද්ධව ද, ඒ නියමය අමාත්‍යවරයා විසින් ස්ථිර කරනු ලැබිය හැකි ය ; නැතහොත් වෙනස් කරනු ලැබිය හැකි ය ; එසේත් නැතහොත් අවලංගු කරනු ලැබිය හැකි ය. තවද, ඒ වෙළෙන්දගේ බලපත්‍රය අවලංගු කර තිබුණු අවස්ථාවක නම් ඔහුට අළුත් බලපත්‍රයක් නිකුත් කරන ලෙසද, බලපත්‍රය අත්හිටුවා තිබුණු අවස්ථාවක නම්, ඒ අත්හිටුවීම අවසන් කරන ලෙසද, අමාත්‍යවරයා විසින් නියම බලධරයාට නියම කරනු ලැබිය හැකි ය.

(3) අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

13අ. (1) මේ කොටසෙහි හෝ II වන කොටසෙහි හෝ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් හෝ 2 වන නියෝගය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක කොන්දේසි අතුරින් යම් කොන්දේසියක් හෝ 2 වන නියෝගය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තකු විසින් කඩකර ඇති බවට, නියම බලධරයා අවශ්‍ය යයි සලකන විභාගයකින් පසු ඔහු සෑහීමට පත් වුවහොත් 12 වන සහ 13 වන නියෝගවල විධිවිධාන කෙසේ වුව ද, ඔහු විසින්—

(අ) ඒ තැනැත්තාට නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකි අතර එය අවලංගු කළ බව වහාම එම තැනැත්තාට දැනුම් දිය හැකි ය ; තවද

(ආ) කඩකිරීම කරන ලද අවස්ථාවේ ඒ තැනැත්තාගේ සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනය යටතේ තිබුණා වූ යම් භාණ්ඩයක් තහනමට ගෙන රාජ්‍ය සන්තක කරනු ලැබිය හැකි ය.

(2) මේ නියෝගයේ (1) (ආ) ඡේදය යටතේ හෝ 15 වන නියෝගයේ (2) වන ඡේදයේ (ආ) අනුඡේදය යටතේ හෝ යම් භාණ්ඩයක් තහනමට ගෙන, රාජ්‍ය සන්තක කරනු ලැබූ අවස්ථාවක, ඒ භාණ්ඩය සම්බන්ධයෙන් වන්දි ගෙවීමට අදාළව (8) වන ඡේදය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලබන යම් විධානයකට හෝ (6) වන ඡේදය යටතේ පවරන ලද යම් නඩුවක යම් නඩු තීන්දුවකට යටත් ව, නියම බලධරයා, ඒ තැනැත්තාට වන්දි ගෙවීමට යටත් නොවන්නේ ය.

(3) (1) (අ) ඡේදය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමෙන් යම් තැනැත්තකු අතෘප්තියට පත් වන අවස්ථාවක ඔහු විසින් ඒ අවලංගු කිරීම දැනුම් දෙනු ලැබීමෙන් දින දහහතරක් ඇතුළත ඒ අවලංගු කිරීමට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(4) (3) වන ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කරන ලද යම් නියමයක් අවසානාත්මක හා තීරණාත්මක වන අතර එම නියමය කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(5) (3) වන ඡේදය යටතේ අමාත්‍යවරයා වෙත කරන ලද අභියාචනයකට අමාත්‍යවරයා විසින් ඉඩ දෙනු ලැබූ අවස්ථාවක ඔහු විසින් බලපත්‍රය නැවත නිකුත් කරන ලෙස විධාන කළ හැකි ය.

(6) මේ නියෝගයේ (1) (ආ) වන ඡේදය හෝ 15 වන නියෝගයේ (2) වන ඡේදයේ (ආ) අනුඡේදය යටතේ හෝ යම් භාණ්ඩයක් තහනමට ගෙන රාජ්‍ය සන්තක කිරීම නිසා යම් තැනැත්තකු අතෘප්තියට පත් වන අවස්ථාවක, ඔහු විසින්—

(අ) එම තහනමට ගෙන රාජ්‍ය සන්තක කරනු ලැබූ දින සිට දින දහහතරක් ඇතුළත ඒ තහනමට ගැනීමට සහ රාජ්‍ය සන්තක කිරීමට විරුද්ධව අමාත්‍යවරයාට අභියාචනය කළ හැකි ය ; නැතහොත්

(ආ) එම තහනමට ගැනීම සහ රාජ්‍ය සන්තක කිරීම සම්බන්ධයෙන් උචිත අධිකරණයෙහි නඩුවක් පැවරීමට තමා අදහස් කරන බව, එසේ තහනමට ගෙන රාජ්‍ය සන්තක කරනු ලැබීමෙන් දින දහහතරක් ඇතුළත නියම බලධරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය හැකි ය.

(7) (6) වන ඡේදයේ (අ) අනුඡේදය යටතේ කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කරනු ලබන යම් නියමයක් අවසානාත්මක හා තීරණාත්මක වන අතර ඒ නියමය යම් අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(8) (6) වන ඡේදයේ (අ) අනුඡේදය යටතේ අමාත්‍යවරයා වෙත කරනු ලැබූ යම් අභියාචනයකට අමාත්‍යවරයා විසින් ඉඩ දෙනු ලබන අවස්ථාවක ඔහු විසින් භාණ්ඩය ආපසු දෙන ලෙස හෝ, ඒ භාණ්ඩය සඳහා වන්දි ගෙවන ලෙස හෝ විධාන කරනු ලැබිය හැකි ය. මේ ඡේදය යටතේ යම් තැනැත්තකුට ගෙවන ලෙස විධාන කෙරෙන වන්දි මුදල, ඒ භාණ්ඩය සම්බන්ධයෙන් මේ නියෝග යටතේ නියම කර ඇති උපරිම සිල්ලර මිලට හෝ, ඒ භාණ්ඩය විකිණීමෙන් නියම බලධරයා ලබා ගත් මුදල ඒ උපරිම සිල්ලර මිලට වඩා අඩු නම් ඒ විකිණීමෙන් ලබා ගත් මුදලට හෝ වැඩි නොවිය යුතු ය.

(9) (6) වන ඡේදයේ (ආ) අනුඡේදය යටතේ දැන්වීමක් කරනු ලැබුවේ යම් නඩුවක් සම්බන්ධයෙන් ද ඒ නඩුව ඒ දැන්වීමේ දින සිට දින දහහතරක් ඇතුළත උචිත අධිකරණයෙහි පවරනු නොලැබුවහොත් ඒ දැන්වීම කරන තැනැත්තාට එසේ තහනමට ගෙන රාජ්‍ය සන්තක කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් වැඩිදුරටත් කිසිදු හිමිකම් පෑමක් කළ නොහැකි වන්නේ ය.

(10) (6) වන ඡේදයේ (ආ) අනුඡේදය යටතේ දැන්වීමක් කරනු ලැබුවේ යම් නඩුවක් සම්බන්ධයෙන් ද ඒ නඩුවේ දී ඒ භාණ්ඩය සම්බන්ධයෙන් මේ නියෝග යටතේ නියම කර ඇති උපරිම සිල්ලර මිලට හෝ, ඒ භාණ්ඩය විකිණීමෙන් නියම බලධරයා ලබා ගත් මුදල ඒ උපරිම සියල්ලර මිලට වඩා අඩු නම් ඒ විකිණීමෙන් ලබා ගත් මුදලට හෝ වැඩි ප්‍රමාණයක් වන්දි මුදලක් වශයෙන් ලැබීමට පැමිණිලිකරු හිමිකම් නොලබන්නේ ය.

(11) (6) වන ඡේදයේ (අ) අනුඡේදය යටතේ අමාත්‍යවරයා වෙත අභියාචනයක් කරනු ලැබුවේ හෝ (6) වන ඡේදය (ආ) අනුඡේදය යටතේ දැන්වීමක් කරනු ලැබුවේ හෝ වුව ද නියම බලධරයා විසින් එසේ තහනමට ගෙන රාජ්‍ය සන්තක කරනු ලැබූ භාණ්ඩ ඔහු විසින් බැහැර කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

14. (1) කිසිම තැනැත්තකු විසින් කිසිම වීථියක් තුළ හෝ වීථියක බලපත්‍ර නොලත් යම් භාණ්ඩයක් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, විකිණීම සඳහා තැබීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

(2) (1) වන ඡේදයේ විධිවිධාන කඩ කරමින්, එවැනි යම් භාණ්ඩයක් විකුණනු ලැබුවේ, විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබුවේ, විකිණීම සඳහා තබනු ලැබුවේ හෝ ප්‍රදර්ශනය කරනු ලැබුවේ යම් ගොඩනැගිල්ලක් තුළ ද, ඒ ගොඩනැගිල්ල නියම බලධරයා විසින් කඩා බිඳ දැමීමට හෝ ඉවත් කිරීමට සලස්වනු ලැබිය හැකි අතර ඒ භාණ්ඩය රාජ්‍ය සන්තක කරනු ලැබිය හැකි ය.

15. (1) කිසිම තැනැත්තකු විසින්, ඔහු විසින් ඔප්පු කළ යුතු නීත්‍යානුකූල බලයක් හෝ යුක්තිසහගත නිදහසට කරුණක් නොමැතිව, කිසිම බලපත්‍ර නොලත් භාණ්ඩයක් තම සන්තකයෙහි, භාරයෙහි හෝ තම පාලනය යටතේ තබා ගැනීම නොකළ යුතු ය.

(2) නියම බලධරයා විසින්—

(අ) බලපත්‍ර නොලත් යම් භාණ්ඩ ඇතැයි ඔහු සැක කරන යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ සියලු යුක්තිසහගත වේලාවන්හි දී ඇතුළුවීම සහ ඒ ගොඩනැගිල්ල හෝ ස්ථානය සෝදිසි කිරීම ;

(ආ) මේ නියෝගය යටතේ ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඩා විවෘත කිරීම යුක්තිසහගත ව අවශ්‍ය යයි ඔහු සලකන යම් දොරක්, සුරක්ෂිතාගාරයක්, පෙට්ටියක්, ට්‍රන්ක් පෙට්ටියක්, පොට්ටනියක් හෝ වෙනත් තැනක් හෝ ගබඩාවක් කඩා විවෘත කිරීම ; සහ

(ඇ) එවැනි යම් භාණ්ඩ කිසිවක් ඔහු සොයා ගත් අවස්ථාවක ඒවා තහනමට ගෙන රාජ්‍ය සන්තක කිරීම ;

කරනු ලැබිය හැකි ය.

15අ. යම් තැනැත්තකු විසින් කරන ලදැයි කියනු ලබන මේ නියෝග යටත් වූ වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක දී කෙරෙන නඩු කටයුතුවලට ඒ අධිකරණයේ වෙනත් සියලු කටයුතුවලට ඉහළින් ප්‍රමුඛත්වය ලැබිය යුතු ය.

15ආ. යම් තැනැත්තකු මේ නියෝග යටතේ වූ යම් වරදකට වරදකරු කරනු ලැබූ නැතහොත් මේ නියෝග යටතේ යම් භාණ්ඩයක් තහනමට ගෙන රාජ්‍ය සන්තක කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ වරදකරු කිරීමට හෝ එම භාණ්ඩ තහනමට ගෙන රාජ්‍ය සන්තක කිරීමට තුඩු දුන් තොරතුරු සැපයූ යම් තැනැත්තකුට ; සහ

(ආ) ඒ වරදකරු කිරීමට අදාළ සොයා ගැනීමෙහි ලා හෝ එම භාණ්ඩය තහනමට ගෙන රාජ්‍ය සන්තක කිරීම ක්‍රියාත්මක කිරීමෙහි ලා සම්බන්ධ යම් තැනැත්තකුට ;

නියම බලධරයා විසින් තමා සාධාරණ යයි සලකන ත්‍යාග මුදලක් ගෙවනු ලැබිය හැකි ය.

15ඇ. 2 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මේ නියෝග යටතේ අවලංගු කරනු ලැබූ අවස්ථාවක හෝ යම් තැනැත්තකු සන්තකයෙහි තිබූ යම් භාණ්ඩයක් මේ නියෝග යටතේ තහනමට ගෙන රාජ්‍ය සන්තක කරනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ බලපත්‍රය දරන්නාගේ හෝ තහනමට ගෙන රාජ්‍ය සන්තක කරන ලද භාණ්ඩ යම් තැනැත්තකු සන්තකයෙන් තහනමට ගන්නා ලද්දේ ද ඒ තැනැත්තාගේ හෝ නම සහ ලිපිනය නියම බලධරයා විසින් සුදුසු යයි තමා සලකන ආකාරයකට පළ කිරීම හෝ පළ කරවීම හෝ කරනු ලැබිය හැකි ය.

16. මේ නියෝගවල, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස—

" භාණ්ඩ " යන්නෙන් යම් ආහාර පාන හෝ මහජනයාගේ ජීවිතයට අවශ්‍ය කරන්නා වූ සහ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් නියම බලධරයා විසින් දක්වනු ලබන්නා වූ වෙළෙඳ භාණ්ඩයක් අදහස් වේ ;

" නියම බලධරයා " යන්නෙන්—

(අ) මේ නියෝගවල කාර්යය සඳහා නියම බලධරයකු වීමට අග්‍රාමාත්‍යවරයා විසින් නමින් හෝ නිලයෙන් පත් කරනු ලබන යම් තැනැත්තෙක් ;

(ආ) මුළු දිවයින සඳහා, මිල පාලක (ආහාර හා විවිධ භාණ්ඩ), නියෝජ්‍ය මිල පාලක (ආහාර හා විවිධ භාණ්ඩ) සහ සෑම සහකාර මිල පාලකයකුම (ආහාර හා විවිධ භාණ්ඩ) ; සහ

(ඇ) එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා, ඒ දිස්ත්‍රික්කයේ දිසාපති, අතිරේක දිසාපති සහ සෑම සහකාර දිසාපතිවරයකු ම

අදහස් වෙති.

" වීථිය " යන්නට යම් පදික වේදිකාවකින් ආවරණය වූ හෝ නොවූ ඉඩම සහිතව මහජනයාට මාර්ග අයිතියක් ඇත්තා වූ, ප්‍රසිද්ධ පාරක් වුව ද නොවුව ද යම් පාරක්, පටු මඟක් හෝ පටු පාරක් මෙන්ම එයට අයිති වූ හෝ අනුබද්ධ වූ සියලු කානු, කණ්ඩි සහ අගල් හෝ එහි ආරක්ෂාව හෝ ප්‍රයෝජනය සඳහා වෙන් කොට තිබිය හැකි යම් වීථියකට හෝ පාරකට යාබදව පිහිටි පොදු එළිමහන් ස්ථාන සහ මුඩු බිම් ද ඇතුළත් වේ ; තවද

" බලපත්‍ර නොලත් භාණ්ඩය " යන්නෙන්—

(i) රේගු ආඥාපනතේ විධිවිධාන කඩ කරමින් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ හෝ ගෙනෙනු ලැබූ යම් භාණ්ඩයක් ; හෝ

(ii) යම් භාණ්ඩයක් බෙදා හැරීම ආහාර පාලන පනත යටතේ විධිමත් කරනු ලැබ ඇත ද එම භාණ්ඩය ; හෝ

(iii) ආණ්ඩුවට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයිති යම් භාණ්ඩයක් හෝ දෙයක් ; හෝ

(iv) භාණ්ඩයක් වෙළෙඳාම් කිරීම පිණිස 2 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකු නොවන තැනැත්තකුගේ සන්තකයේ ඇති එම භාණ්ඩ ; හෝ

(v) 2 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයෙහි සඳහන් නොවන ස්ථානයක තිබී සම්භවන යම් භාණ්ඩයක් ; හෝ

(vi) (අ) වෙළෙන්දකු සන්තකයෙහි තිබී, ඒ වෙළෙන්දගේ සාමාන්‍ය වෙළෙඳ කටයුතු අවශ්‍යතා ඉක්මවා යන බව නියම බලධරයාගේ මතය වන ප්‍රමාණයකින් සම්භවන ; හෝ

(ආ) වෙනත් යම් තැනැත්තකු සන්තකයෙහි තිබී ඒ තැනැත්තා හෝ සාමාන්‍ය පෞද්ගලික අවශ්‍යතා ඉක්මවා යන බව නියම බලධරයාගේ මතය වන ප්‍රමාණයකින් සම්භවන ;

යම් භාණ්ඩයක් අදහස් වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී